# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2466/61 - 2025 දෙසැම්බර් මස 13 වැනි සෙනසුරාදා - 2025.12.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : DIVPG/LND/LA/AQURE/6/15.
ඉඩම් අමාත්‍යාංශ ගොනු අංකය*:* 4-3/7/2020/HW/137.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩම්/ විස්තරය:*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 893 පරබෑවිල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සර්වේ ජනරාල් විසින් මැන සකස් කරන ලද කැඩැස්තර සිතියම් අංක 421731 කලාප අංක 01 පත්‍ර අංක 03 හා 2025.11.21 දිනැති සිතියමේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැලි

01. **කැබලි අංක 1**
ඉඩමේ නම: නුගවෙල කුඹුර; හිමිකම් කියන්නා: හේරත් මුදියන්සේලාගේ ජයන්ති තිලකසිරි හේරත්, හේරත් මුදියන්සේලාගේ නාලනී සිරියලතා නුගවෙල, හේරත් මුදියන්සේලාගේ දීපා ලාලනී හේරත්; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0208.

02. **කැබලි අංක 2**
ඉඩමේ නම: මෙඬේරිවත්ත *නොහොත්* හිටිනාවත්ත; හිමිකම් කියන්නා: අධිකාරි මුදියන්සේලාගේ කරුණාවතී; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0355.

03. **කැබලි අංක 3**
ඉඩමේ නම: ගලහිටියාව කුඹුර; හිමිකම් කියන්නා: අධිකාරි මුදියන්සේලාගේ නන්දාවතී (මියගොස්); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0318.

04. **කැබලි අංක 4**
ඉඩමේ නම: ගලහිටියාව කුඹුර; හිමිකම් කියන්නා: අතුරුගිරිය ආරච්චිලාගේ චන්ද්‍රසිරි බණ්ඩාර අතුරුගිරිය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0322.

05. **කැබලි අංක 5**
ඉඩමේ නම: මෙඬේරිවත්ත *නොහොත්* හිටිනාවත්ත; හිමිකම් කියන්නා: අතුරුගිරිය ආරච්චිලාගේ පුෂ්පා කාන්ති අතුරුගිරිය සහ අතුරුගිරිය ආරච්චිලාගේ චන්ද්‍රසිරි බණ්ඩාර අතුරුගිරිය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0442.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**06. කැබලි අංක 6**

ඉඩමේ නම: කොටඉස්සරකුඹුර; හිමිකම් කියන්නා: කුමාරගේ කමල්සිරි සේනාධීර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0581.

**07. කැබලි අංක 7**

ඉඩමේ නම: වලලියද්ද; හිමිකම් කියන්නා: අබේසිංහ අච්චිල්ලාගේ ඩිංගිරිඅම්මා; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0011.

**08. කැබලි අංක 8**

ඉඩමේ නම: වලලියද්ද; හිමිකම් කියන්නා: රාජපක්ෂගේ මංජුල ප්‍රියංකර රාජපක්ෂ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0311.

**09. කැබලි අංක 9**

ඉඩමේ නම: වලලියද්ද; හිමිකම් කියන්නා: අබේසිංහ අච්චිල්ලාගේ මුතුමැණිකා (මියගොස්); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0228.

**10. කැබලි අංක 10**

ඉඩමේ නම: සොයාගත නොහැක; හිමිකම් කියන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0028.

**11. කැබලි අංක 11**

ඉඩමේ නම: පොල්ගහමුල කුඹුර; හිමිකම් කියන්නා: අබේසිංහ අච්චිල්ලාගේ ඩිංගිරිඅම්මා සහ මුහන්දිරම්ගේ රදීකා ලක්මාලි පීරිස්; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0472.

**12. කැබලි අංක 12**

ඉඩමේ නම: බක්මීගහමුලකුඹුර; හිමිකම් කියන්නා: මුල්හිරි අච්චිල්ලාගේ ලීලාවතී; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0387.

ඉහත සඳහන් ඉඩම්වලට/ පරවශතාවයන්ට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2026 ජනවාරි මස 07 වැනි දින පෙ.ව. 10.00 ට පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2025 දෙසැම්බර් මස 24 වැනි දිනට මත්තෙන් එම ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම්/පරවශතාවයන් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ආර්. එම්. එස්. එන්. රාජපක්ෂ,
ප්‍රාදේශීය ලේකම්,
පොල්ගහවෙල.

2025 දෙසැම්බර් මස 10 වැනි දින,
පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12-0098

---

## ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: 4/1/1/11.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 13/96/HW/311.

උක්ත ශීර්ෂය යටතේ 1998 ඔක්තෝබර් මස 02 වැනි දින මවිසින් අංක 1047/23 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය* යටතේ පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7වැනි වගන්තිය යටතේ දැන්වීමෙහි "මු.පි.කු. 1932 හි කැබලි අංක 17 සහ 18 දරන ඉඩම් කැබලිවලට/ පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනා, තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 1998.11.23 වැනි දින අපර භාග 2.00 සිට කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය'' යන ලෙසත්, 1998.11.10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම්/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය'' යන ලෙසත් සඳහන් කර ඇත. එය ඉවත් කොට, "2025.12.24 වැනි දින පූර්ව භාග 10.00 සිට කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය'' යන ලෙසත් "2025.12.17 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ සැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය'' යන ලෙස ආදේශ කිරීමෙන් එම දැන්වීම පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| ඉවත් කළ යුතු දින | ඉවත් කළ යුතු දින වෙනුවට ආදේශ කළ යුතු දින |
|---|---|
| සම්මුඛ විය යුතු දිනය 1998.11.23 | 2025.12.24 |
| ලියවිලි භාර දිය යුතු දිනය 1998.11.10 | 2025.12.17 |

ඩබ්. එස්. සේනාතිස්ස,
ප්‍රාදේශීය ලේකම් හා ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
කුරුණෑගල.

2025 නොවැම්බර් මස 17 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12-0100

ශුද්ධි පත්‍රිකාව

**1964 අංක 28 දරන අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි**

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ යොමු අංකය: HAK/LAN/1/19

1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වැනි වගන්තිය යටතේ 2025 පෙබරවාරි මස 19 වැනි දින අංක 2424/49 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට් පත්‍රයේ* III වැනි කොටසේ පළ කරන ලද මගේ යොමු අංක HAK/LAN/1/19 සහ 2025 මැයි මස 28 වැනි දින පරීක්ෂණ දිනය සහ වේලාවද, වන්දි ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු දිනය පහත පරිදි සංශෝධනය කරමි.

9 වන වගන්තිය හිමිකම් පරීක්ෂණ දිනය හා වේලාව –2026.01.26 දින පෙරවරු 10.00 වන්දි ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුතු දිනය—2026.01.05

**තීක්ෂණ දිසානායක,**
**ප්‍රාදේශීය ලේකම්,**
**හක්මණ.**

2025 දෙසැම්බර් මස 05 වැනි දින,
හක්මණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12-0101

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.